# බළන්ගොඩ නගර සභාව

## 2019-04-09 දින මහා සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය - 2019.04.09**

**වේලාව - පෙ.ව. 10.00**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙදින සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | චමික ජයමිණි විමලසේන |
| 2. ගරු උප සභාපති | එම්. ටී. එම්. රූමි මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | ර්. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රී | එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 9. ගරු නාගරික මන්ත්‍රිනි | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 10. ගරු නාගරික මන්ත්‍රී | එම්. එස්. පී. ගලප්පත්ති මැතිතුමා |
| 11. ගරු නාගරික මන්ත්‍රී | එම්. ඩබ්. විමලසිරි මැතිතුමා |
| 12. ගරු නාගරික මන්ත්‍රී | එම්. එම්. රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා |
| 13. ගරු නාගරික මන්ත්‍රිනි | පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය |
| 14. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. එස්. ඩී. වීරසිංහ මැතිතුමිය |
| 15. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. ශාන්තිලේඛා මැතිතුමිය |
| 16. ගරු නාගරික මන්ත්‍රී | කේ. ජී. පේමදාස මැතිතුමා |
| 17. ගරු නාගරික මන්ත්‍රී | අකිල එල්ලාවළ මැතිතුමා |

**නිළධාරී සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ලේකම් | එස්. එච්. ඒ. කරුණාරත්න මිය |

**01. පසුගිය සභාවේ සභා වාර්තාව සම්මත කිරීම**

2019-04-09 වන දින මාසික මහසභාවේ වැඩකටයුතු ආරම්භ කල ගරු සභාපතිතුමන් විසින්, 2019.03.12 දින පැවති මහ සභාවේ සභා වාර්තාව සත්‍යය වාර්තාවක් බවට සභා සම්මත කර ගන්නා ලෙස පවසා සිටින ලදී.

එහිදී ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා විසින් 2019.03.12 දින පැවති මහ සභාවේ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සත්‍යය වාර්තාවක් බවට යෝජනා කල අතර ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමළසිරි මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

මෙදින සභා වාර්තාව සඳහා සංශෝධන කිසිවක් ඉදිරිපත් නොවිණි.

**02. ගරු සභාපතිතුමා විසින් කරනු ලබන නිවේදන**

ගරු සභාපතිතුමන් විසින් මෙහිදී නිවේදන ආරම්භ කරමින් 2018 වර්ෂයේ කාර්යය සාධන තරඟයෙන් සබරගමුව පළාතේ රන් සම්මානය දිනා ගැනීම සඳහා කැපවූ ගරු උප සභාපතිතුමන්, නාගරික මන්ත්‍රිවරුන්,ලේකම්,ගණකාධිකාරී,ප්‍රධාන කළමණාකරණ සහකාර, කාර්ය මණ්ඩලය ,සේවකයන් හා නගර සභාවේ තොරතුරු සමාජගත කරන මාධ්‍යවේදීන්ට සභාවේ සභාපතිවරයා ලෙස ස්තුති කිරීමට මෙය අවස්ථාවක් කරගන්නා බව පවසා සිටි අතර ඉදිරි වර්ෂයන්හිදී මෙවැනි ජයග්‍රහණයන් මීටත් වඩා සාර්ථක අයුරින් ලබාගැනීමට අපේක්ෂා කරන බවද පවසා සිටින ලදී.

**03. සංදේශ/පැමිණිලි/පෙත්සම්/ආයාචනා ඉදිරිපත් කිරීම**

***03:01 කම්කරු විනිශ්චය සභාව බලංගොඩ නගරයේ ස්ථාපිත කිරීම***

කම්කරු විනිශ්චය සභාව බලංගොඩ නගරයේ ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් සභාවේ යෝජනා ස්ථිර කර ගනිමින් යවන ලද ලිපියට ගරු අධිකරණ අමාත්‍ය තළතා අතුකෝරාල මැතිතුමිය විසින් එවන ලද ලිපිය ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර අවුරුදු 30 ක ඉල්ලීමක් වන අතිරේක දිසා මහේස්ත්‍රාත් අධිකරණයක් බලංගොඩ

නගරයට ඇය විසින් ලබාදුන් බැවින් මහජනයාගේ බලවත් ඉල්ලීම සලකා කම්කරු විනිශ්චය සභාව බලංගොඩ නගරයේ  නැවත ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් අවධානය යොමු කරන මෙන් ඇයගෙන් ඉල්ලා සිටින බව ගරු සභාපතිතුමන් විසින් මෙහිදී පවසා සිටින ලදී.

**04. කල් දී ඇති ප්‍රශ්න**

**ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා**

**04:01 2019.02.12 දින පැවති මහ සභාවේ ඇස්තමේන්තු අනුමත කල "දෙණියකුඹුර සුමිත් දයානන්ද මහතාගේ නිවස අසළින් අවසන් වන මාර්ගය සංවර්ධනය කිරීම සහ උඩ ඇල්ලෙපොල මාළිගාතැන්න  කුෂන් කඩය ඉදිරිපිට මාර්ගය සංවර්ධනය කිරීම මේ දක්වා ක්‍රියාත්මක නොකිරීමට හේතුව කුමක්ද?**

මේ සඳහා පිළිතුරු ලබාදුන් ගරු සභාපතිතුමන් විසින්,  මේ සම්බන්ධයෙන් වැරදි වටහාගැනීම් තබා නොගන්නා ලෙසත්, සභාවේ යෝජනා සම්මත වන සෑම යෝජනාවක්ම ඉටුකිරීම අපහසු අතර සභාව සතු ප්‍රතිපාදන පසුගිය කාල වකවාණුවේ දේශිය ණය හා සංවර්ධන අරමුදල යටතේ ලබාගෙන ඇති ණය හා පොළිය ගෙවීමට සිදු වීම ඉතා අර්බුදකාරී තත්වයක් බවත් පෙන්වා දෙන ලදී. මේ අයුරින් සංවර්ධන යෝජනා සඳහා වෙන්කර ඇති මුදල් ණය හා පොලී ගෙවීමට සිදු වීමෙන් සිදුවන්නේ සභාවේ සංවර්ධනය ඇහිරී යන බව පවසා සිටි ගරු සභාපතිතුමන් විසින් ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමන් විසින් ඉහතින් දක්වා ඇති සංවර්ධන යෝජනා සම්බන්ධයෙන් ඉදිරියේදි ක්‍රියා කිරීමට බලාපොරොත්තු වන බව පවසා සිටින ලදී.

**05. කල්  දී ඇති යෝජනා**

***05:01   ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා***

**05:01:01   කිරිදිගල පිලීෂියස් මහතාගේ නිවසට යන මාර්ගය සාන්ත අන්තෝනී මාවත නමින් නම් කිරීම.**

කිරිදිගල පිලීෂියස් මහතාගේ නිවසට යන මාර්ගයේ නිවැසියන් විසින් එම මාර්ගය සාන්ත අන්තෝනී මාවත නමින් නම් කරන මෙන් ඉල්ලා ඉදිරිපත් කරන ලද ලිපිය සලකා බලා

ගරු සභාපතිතුමන් විසින් එම යෝජනාව සභාවට ඉදිරිපත් කරන ලදී. එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී මේ සම්බන්ධයෙන් විරෝධතා කැඳවීමෙන් පසුව ඉදිරි වැඩ කටයුතු සම්බන්ධව ක්‍රියා කිරීම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් පවසා සිටින ලදුව සභාවේ විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**05ඃ01ඃ02 බස් නැවතුම්පොළ ණය මුදල ගෙවීම .**

දේශිය ණය සහ සංවර්ධන අරමුදල යටතේ බස් නැවතුම්පොළ සංවර්ධනය සඳහා ලබාගෙන ඇති ණය මුදල ගෙවීම සඳහා සහා අනුමැතිය පතමින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මේ පිළිබඳ අදහස් දැක්වූ ගරු සභාපතිතුමන් විසින්, පළාත් සභා හා පළාත් පාලන රාජ්‍යය ලේකම්තුමන්ගේ ප්‍රධානත්වයෙන් හා දේශිය ණය සහ සංවර්ධන අරමුදලේ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් මේ පිළිබඳව සාකච්ඡාවක් රත්නපුර ප්‍රධාන ලේකම් කාර්යාලයේදි පැවැත්වූ අතර, මෙම ණය මුදල හා පොළිය පිළිබඳව යම් සහනයක් සිදු කර දෙන මෙන් කරන ලද ඉල්ලීම සලකා පොළී මුදල් ප්‍රමාණය ඉවත්කර ගැනීමට හැකිවූ බවත් ණය මුදල වාරික වශයෙන් වර්ෂ 15 ක් පුරා ගෙවීමට සිදුවන බවත් මෙහිදී වැඩිදුරටත් පවසා සිටින ලදී.

**මෙහිදී මේ සම්බන්ධව සභාවේ විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**05ඃ01ඃ03 බැංකියවත්ත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ කොම්පෝස්ට් ව්‍යාපෘතියේ සංවර්ධන කටයුතු සඳහා මහජන සෞඛ්‍ය පරීක්ෂක නිමල් ප්‍රේමතිලක මහතාගේ සේවය ලබාගැනීම.**

බැංකියවත්ත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ කොම්පෝස්ට් ව්‍යාපෘතියේ සංවර්ධන කටයුතු සඳහා මහජන සෞඛ්‍ය පරීක්ෂක නිමල් ප්‍රේමතිලක මහතාගේ සේවය ලබාගැනීම සඳහා වූ යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත්

කරන ලද අතර ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී මහජන සෞඛ්‍ය පරීක්ෂක නිමල් ප්‍රේමතිලක මහතාගේ සේවය ලබාගැනීම සඳහා විපක්ෂව අදහස් දක්වමින් ගරු නාගරික මන්ත්‍රි අකිළ එල්ලාවල මැතිතුමන් හා ගරු නාගරික මන්ත්‍රි වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමන් කරුණු පෙන්වා දුන් අතර පක්ෂව අදහස් දක්වමින් ගරු නාගරික මන්ත්‍රි ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමන් හා ගරු නාගරික මන්ත්‍රි එම්.ජුනයිදීන් මාලික්ෂා මැතිතුමන් විසින් කරුණු ඉදිරිපත් කරන ලදී.

මෙහිදී ගරු සභාපතිතුමන් විසින් අදහස් දක්වමින්,මෙතුමා කසළ කළමණාකාරිත්වය පිළිබඳව දක්ෂ නිළධාරියෙක් බැවින් ඔහු සතු තාක්ෂනික දැනුම බැංකියවත්ත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ කොම්පෝස්ට් ව්‍යාපෘතියේ සංවර්ධන කටයුතු සඳහා යොදාගැනීමට අපේක්ෂා කරන බව පවසා සිටින ලදී.

මෙහිදී මේ සම්බන්ධව සභාවේ විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**05ඃ01ඃ04 බැංකියවත්ත කසළ අංගනයට යාබද ආර්. සුමනරත්න මහතා සතු බතලවත්ත නැමති ඉඩම මිලදී ගැනීම.**

බැංකියවත්ත කසළ අංගනයට යාබද ආර්. සුමනරත්න මහතා සතු බතලවත්ත නැමති ඉඩම මිලදී ගැනීම සඳහා වූ යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර,ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී මේ සම්බන්ධව සභාවේ විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**05:01:05 රත්නපුර මධ්‍ය පුස්තකාලය විසින් මෙහෙයවනු ලබන පිරුලු ක්‍රමයට එකඟතාවය පළකිරීම**

සබරගමුව පළාත් මධ්‍ය පුස්තකාලය මගින් පළාතේ මහජන පුස්තකාල පාඨකයින් සඳහා පොත් බැහැර දීම "අන්තර් පුස්තකාල පිරුළු ක්‍රමය" යටතේ සිදු කිරීමට සූදානමින් පවතින බවත් ඒ සඳහා ගරු ආණ්ඩුකාරතුමන්ගේ ප්‍රධානත්වයෙන් අදාළ සහයෝගිතා ගිවිසුම අත්සන් තැබීමට නියමිත බැවින් මේ සඳහා එකඟත්වය පලකිරීමේ යෝජනාව ගරු සභාපතිතුමන් සභාවට ඉදිරිපත් කරන ලදී. එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී මේ සම්බන්ධව සභාවේ විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**05:01:06 තුරු උයන ආදායම් උත්පාදන ව්‍යාපෘතියක් වශයෙන් වැඩිදියුණු කිරීම**

තුරු උයන භූමිය ආදායම් උත්පාදන ව්‍යාපෘතියක් වශයෙන් වැඩිදියුණු කිරීම සඳහා වූ යෝජනාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු සභාපතිතුමන් විසින් වැඩි දුරටත් අදහස් දක්වමින් බලංගොඩ නගර සභාවට ආදායම් ව්‍යාපෘතියක දැඩි අවශ්‍යතාවයක් පවතින බවත්, 2019 මැයි මාසයේ සිට බස්නැවතුම්පළ සඳහා ලබාගත් ණය මුදලේ වාරිකය ගෙවීමට සිදුවෙන බැවින් හා දූනට කාණු පද්ධතිය සඳහා ලබාගත් ණය මුදල ගෙවීමට සිදුවන බැවින් නව ආදායම් ප්‍රභවයක් ඇති කිරීමේ අවශ්‍යතාවය පදනම් කොට ගෙන තුරු උයන භූමිය ආදායම් උත්පාදන ව්‍යාපෘතියක් ලෙස නගර වැසියන්ට විවේක ගත හැකි ස්ථානයක් වශයෙනුත් වැඩි දියුණු කිරීමට අපේක්ෂා කරන බව පවසා සිටින ලදී.

මේ සම්බන්ධව සභාවේ විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

## 06. මන්ත්‍රී යෝජනා

06:01 **-ගරු නාගරික මන්ත්‍රිනි පී.චන්ද්‍රලතා මැතිතුමිය**

06:01:01 හුණුකුඹුර, දෙල්ගස්වත්ත මාර්ගයේ රොෂාන් මහත්මාගේ නිවෙසේ සිට ඉහළට මීටර් 100 ප්‍රමාණයකට කොන්ක්‍රීට් කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.

06:01:02 සුදර්ශනගම ඉහළ මාර්ගයේ කැඩී ඇති ස්ථාන ප්‍රතිසංස්කරණය කිරීම.

-

ගරු නාගරික මන්ත්‍රිනි පී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රිනි පී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් හුණුකුඹුර, දෙල්ගස්වත්ත මාර්ගයේ රොෂාන් මහත්මාගේ නිවෙසේ සිට ඉහළට මීටර් 100 ප්‍රමාණයකට කොන්ක්‍රීට් කර දෙන මෙන් ඉල්ලා සිටි අතර ඒ සඳහා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් මුදල් ලබා ගැනීමේ හැකියාවක් පවතින බැවින් ඒ සඳහා අවශ්‍ය ඇස්තමේන්තු සභාව විසින් සකස් කර දෙන මෙන් ඉල්ලා සිටින ලදී.

එමෙන්ම, සුදර්ශනගම ඉහළ මාර්ගයේ කැඩී ඇති ස්ථාන ඉතා අබලන් තත්වයේ පවතින බැවින් ප්‍රතිසංස්කරණය කරදෙන මෙන් මහජනයාගෙන් බලවත් ඉල්ලීමක් පවතින බවත්, අප්‍රේල් අවුරුද්දට පෙර එම අවශ්‍ය කටයුතු කර දෙන ලෙසත් මෙහිදී ඉල්ලා සිටින ලදී.

මෙහිදී ගරු සභාපතිතුමන් විසින් පිළිතුරු ලබාදෙමින් ඉහතින් දක්වා ඇති 06:01:01 යෝජනාව සඳහා කඩිනමින් ඇස්තමේන්තු සකස් කර දෙන බවට පවසා සිටි අතර 06:01:02 යටතේ සඳහන් කර ඇති නඩත්තු යෝජනාව ඉදිරියේදි සිදු කිරීමට අවශ්‍ය කටයුතු සිදුකර දෙන බවට පවසා සිටින ලදී.

මෙහිදී මේ සම්බන්ධව සභාවේ විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

06:02 **ගරු නාගරික මන්ත්‍රී ජුනයිදීන් මාලික්ෂා මැතිතුමා**

06:02:01 බලංගොඩ මිරිස්වත්ත සුබයිර් අලීම් මාවතට පිවිසෙන මාර්ගය අඩි 100 දුරට අබලන් වී ඇති කොටස ප්‍රතිසංස්කරණය කිරීම.

06:02:02 බලංගොඩ කහටපිටිය මාර්ගය මුස්තාෆා මාවත අළුත්වැඩියා කිරීම

ගරු නාගරික මන්ත්‍රී ජුනයිදීන් මාලික්ෂා මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.
මෙහිදී අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී ජුනයිදීන් මාලික්ෂා මැතිතුමන් විසින් තමන් විසින් ඉදිරිපත් කර ඇති ඉහත නඩත්තු යෝජනා කඩිනමින් ඉටුකර දෙන මෙන් පවසා සිටි අතර මේ සම්බන්ධව සභාවේ විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

06:03 **ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය**

06:03:01 බලංගොඩ නගරයේ ඇති තාප්පවල දැන්වීම් ඇලවීම තහනම් නාම පුවරු ප්‍රදර්ශනය කිරීම

06:03:02 බලංගොඩ නගර සභා පිටියට අයත් වැසිකිළි දෙක පවිත්‍ර කිරීම හා පුටු 25 ක් ලබාගැනීම

06:03:03 දේශබන්ධු මහතාගේ නිවස පාර හා කාණු පද්ධතිය පිළිසකර කර දීම.

06:03:04 උඩකන්ද පාර අවසාන කොටස පාර හා කාණු දෙපස පිලිසකර කිරීම හා පාරට නැමී ඇති සියළු ගස් කර්මාන්ත කමිටුව හරහා ඉවත්කර දීම

06:03:05 කුණු කසල දිරණ හා නොදිරණ ලෙස වෙන් කිරීම සම්බන්ධව කොට්ඨාශ මට්ටමින් ගෙයින් ගෙට ගොස් දැනුවත් කිරීම.

ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින් ඉදිරිපත් කරන ලද ඉහත යෝජනා ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින් අදහස් දක්වමින්,සබරගමුව පළාත තුල පළාත් පාලන ආයතන සඳහා පැවති කාර්යය

සාධන තරඟාවලියෙන් බලංගොඩ නගර සභාව ප්‍රථම ස්ථානය ලබාගැනීම වෙනුවෙන් සුභපැතීමට මෙය අවස්ථාවක් කර ගන්නා බව පවසා සිටි අතර, කරව්කැටිය මාර්ගයේ සී.සී.විද්‍යාලය ඉදිරිපිට බැනර්,කටවුට් සම්පූර්ණයෙන් ඉවත්කර තිබියදී ජනතා විමුක්ති පෙරමුණේ දැන්වීම් අලවා තිබීම සම්බන්ධයෙන් ගරු සභාවේ අවධානය යොමුකරන මෙන් පවසා සිටින ලදී.

එමෙන්ම, බලංගොඩ නගර සභා පිටියට අයත් වැසිකිළි දෙක පවිත්‍ර කිරීම හා ප්‍රේක්ෂකාගාරය සඳහා පුටු 25 ක් ලබාදීම සම්බන්ධයෙන් සභාවේ අවධානය යොමුකරන මෙන් පවසා සිටි ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය දේශබන්ධු මහතාගේ නිවස පාර හා කාණු පද්ධතිය පිළිසකර කර දීම සම්බන්ධයෙන් කඩිනම් අවධානය යොමුකරන ලෙසත්, උඩකන්ද පාර අවසාන කොටස පාර හා කාණු දෙපස පිලිසකර කිරීම හා පාරට නැමී ඇති සියළු ගස් කර්මාන්ත කමිටුව හරහා ඉවත්කර දීම සඳහා අවශ්‍ය කටයුතු සකස් කර දෙන ලෙසත්, කුණු කසල දිරණ හා නොදිරණ ලෙස වෙන් කිරීම සම්බන්ධව කොට්ඨාශ මට්ටමින් ගෙයින් ගෙට ගොස් දැනුවත් කිරීම සුදුසු බවත් පවසා සිටින ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රි ඩබ්.එම්.එන්.පී.වීරසිංහ මැතිතුමන් විසින් කොට්ඨාශයේ මන්ත්‍රිවරුන් දෙදෙනා ලෙස තමන් හා ගරු නාගරික මන්ත්‍රි ලාල් ගලප්පත්ති මැතිතුමන් විසින් පෙර සභාවලදී මෙම දේශබන්ධු මහතාගේ නිවස පාර හා කාණු පද්ධතිය පිළිසකර කර දීම හා තවත් යෝජනා ඉදරිපත් කර ඇති බවත් නැවත එම යෝජනා ඉදිරිපත් කිරීම වැරදි බවත් පවසා සිටි අතර තමන් විසින් නැවත සභාවට යෝජනා ඉදිරිපත් නොකරන බවද පවසා සිටින ලදී.

ගරු නාගරික මන්ත්‍රි ලාල් ගලප්පත්ති මැතිතුමන් විසින් අදහස් දක්වමින්, මැතිවරණයෙන් තේරි පත්වූ මන්ත්‍රිවරයා ලෙස තමන් විසින් ඉහත යෝජනා ඉදිරිපත් කර ඇති බැවින් නැවත මෙම යෝජනා ඉදිරිපත් කිරීම වැරදි බව පවසා සිටි අතර පෙර සභාවාරයන්හිදී නිහතමානිව හා ක්‍රමානුකූලව සභාව වෙත මෙම යෝජනා ලබාදී ඇති නමුත් මේවන තෙක් ක්‍රියාත්මක නොවීම පිළිබඳව කනගාටුවට පත්වන බවත් පවසා සිටින ලදී.

මෙහිදී අදහස් දක්වූ ගරු සභාපතිතුමන් විසින් කොට්ඨාශ මට්ටමින් කමිටු සකස් කර කසළ ව්‍යාපෘතිය ක්‍රමානුකුලව සිදු කරගෙන යාමට අපේක්ෂා කරන බවත්,ඒ සඳහා සහයෝගය ලබාදෙන ලෙස සියළු මන්ත්‍රිවරුන්ගෙන් ඉල්ලා සිටින බවත් පවසා සිටින ලදී.

උඩකන්ද මාර්ගයේ කසළ ට්‍රැක්ටරය ධාවනය නොවීම සම්බන්ධයෙන් ගරු නාගරික මන්ත්‍රි ලාල් ගලප්පත්ති මැතිතුමන් විසින් කරුණු පවසා සිටි අතර, ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමන් විසින් ද අදහස් දක්වමින් නගරය තුල කසළ ට්‍රැක්ටරය ධාවනය කල නොහැකි මාර්ගවල ත්‍රී විලරයක් යොදවා හෝ කසළ එකතු කිරීම තුළින් නගරයේ එක් එක් ස්ථානවල කසළ දමා යාමේ ගැටළුවට විසඳුමක් ලැබෙන බව පවසා සිටින ලදී.

ඉදිරියේදි කොට්ඨාශ මට්ටමින් කමිටු සකස් කර සුදුසු ක්‍රමවේද ගන්න බව ගරු සභාපතිතුමන් විසින් මෙහිදී පවසා සිටින ලදී.

මේ සම්බන්ධව සභාවේ විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**06:04 ගරු නාගරික මන්ත්‍රිනි තරංගනී සමරසේකර මැතිතුමිය**

06:04:01 බුදුරජාණන් වහන්සේගේ තෙමඟුලට සමගාමීව කිරිදිගල ශෛලතලාරාම විහාරස්ථානයට බැතිමතුන් විශාල පිරිසක් පැමිණෙන බැවින් මාර්ගයේ සංවර්ධන කටයුතු නවතා ඇති ස්ථානයේ සිට විහාරස්ථානයටත් විහාරස්ථානයේ සිට නගරයටත් ගමන්කල හැකි පරිදි අනඳමෙත්ගම, මුගුණමලේ මාර්ගය සංවර්ධනය කිරීම.

ගරු නාගරික මන්ත්‍රිනි තරංගනී සමරසේකර මැතිතුමිය විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු නාගරික මන්ත්‍රි ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරමින් තමන් විසින්ද මේ සම්බන්ධයෙන් පසුගිය සභාවේදි වෙනත් කරුණු ඔස්සේ සාකච්ඡා කල බව පවසා සිටින ලදී.

මේ සම්බන්ධව සභාවේ විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.පී.වීරසිංහ මැතිතුමන් විසින් ආර්.කේ.ගුණපාල මහතා විසින් ඉදිරිපත් කරන ලද ලිපියක් සභාවට ඉදිරිපත් කරමින් ඒ සම්බන්ධව සභාවේ අවධානය යොමු කරන ලෙස පවසා සිටි අතර ආර්.කේ.ජයසුන්දර මහතාගෙන් කසළ ටෙන්ඩරය ඉවත් කිරීමෙන් පසුව ඔහු විසින් තැන්පත් කරන ලද ඇප මුදල් නැවත ලබාදීම සම්බන්ධයෙන් මානුෂීය සිතා බලා මෙම සභාවේ තීරණයක් ගන්නා බවට පසුගිය සභාවේ සාකච්ඡා කරන ලද අතර එය වාර්තාවටද ඇතුළත් විය යුතු බව පවසා සිටින ලදී.

මෙහිදී ගරු සභාපතිතුමන් විසින් ටෙන්ඩර්කරු විසින් ඇප කොන්දේසි කඩ කර ඇති හෙයින් මුදල් ගෙවීමට නීත්‍යානුකුල තත්වයක් නොමැති බවත් ඉදිරියේදී සාධාරණ විසඳුමක් ගන්නා බවත් පවසා සිටින ලදී.

**07. කාරක සභා වාර්තා, කමිටු වාර්තා සළකා බැලීම.**

මෙහිදී 2019.02.25 දින /2019.03.11 දින පැවති මුදල් කමිටු වාර්තා හා 2019.02.22 දිනැති සංවර්ධන උපදේශන කමිටු වාර්තාව ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමළසිරි මැතිතුමන්ගේ යෝජනා ස්ථිරත්වයෙන් සභාවේ ඒකමතිකව සම්මත විය.

**08. ආදායම් වියදම් වාර්තා සළකා බැලීම.**

| | |
|---|---|
| **පුනරාවර්ථන ලැබීම්** | **10,294,734.01** |
| **වෙනත් ලැබීම්** | **421,527.46** |
| **මුලු ලැබීම්** | **10,716,261.47** |
| **පුනරාවර්ථන වියදම්** | **5,830,451.31** |
| **වෙනත් වියදම්** | **1,356,811.87** |
| **මුලු වියදම්** | **7,187,263.18** |

**ඉන්ධන වාර්තාව සභාවට ඉදිරිපත් කිරිම.**

2019 -04-01 සිට 2019-04-30 දක්වා

| වාහන අංකය | මුළු එකතුව |
|---|---|
| 227-5020 | 28,580.00 |
| 227-5020 | 32,790.00 |
| 226-7521 | 12,360.00 |
| 226-7521 | 6,240.00 |
| 56-1906 | 5,150.00 |
| 56-1906 | 10,400.00 |
| BC-0005 | 20,600.00 |
| BC-0005 | 39,000.00 |
| DDR0008 | 1,545.00 |
| DDR0008 | 5,720.00 |
| DPP 0006 | 3,864.00 |
| DPP 0006 | 8,220.00 |
| FCON 0015 | 1,030.00 |
| FCON0015 | 520.00 |
| FP 0002 | 20,650.00 |
| GC 0001 | 1,620.00 |
| GC 0001 | 13,200.00 |
| GK-1483 | 7,181.00 |
| GK-1483 | 5,738.00 |
| GK-6227 | 22,705.00 |
| GK-6227 | 21,876.00 |
| JD-4684 | 1,032.00 |
| JD-4684 | 1,056.00 |
| LL-2110 | 13,892.00 |
| Ll-2110 | 6,240.00 |
| LL-7688 | 5,150.00 |
| LL-7688 | 5,200.00 |
| ND-5124 | 14,008.00 |
| ND-5124 | 10,712.00 |
| OS-0006 | 1,290.00 |
| PF-4006 | 16,895.00 |
| PF-4006 | 13,104.00 |
| QL-2901 | 2,064.00 |

| | |
|---|---|
| QL-2901 | 4,224.00 |
| RB-4786 | 15,988.00 |
| RB-4786 | 15,600.00 |
| RC-1107 | 11,672.51 |
| RC-1107 | 8,320.00 |
| RC-1118 | 16,526.00 |
| RC-1118 | 20,800.00 |
| RC-8183 | 9,744.80 |
| RE-2600 | 17,510.00 |
| RE-2600 | 9,360.00 |
| RD-8000 | 6,240.00 |
| RD-8240 | 12,875.00 |
| RD-8240 | 15,600.00 |
| UQ - 1933 | 1,290.00 |
| UQ - 1933 | 2,640.00 |
| SDRR 0013 | 5,150.00 |
| SDRR 0013 | 10,400.00 |
| YG-0758 | 1,980.00 |
| ZA - 5039 | 41,395.00 |
| ZA-5039 | 18,720.00 |
| **එකතුව** | **605,667.31** |

**09. පෞද්ගලික මන්ත්‍රී පැහැදිලි කිරීම්**

**<u>ගරු නාගරික මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා</u>**

ඕළුගංතොට රෝහල අසළ පදික කඩ හිමියන් ඉවත් කිරීමෙන් පසුව ඔවුනට ජීවිකාව සරිකර ගැනීම සඳහා අළුත් ස්ථානයක් සභාව විසින් සකස්කිරීම සම්බන්ධයෙන් ප්‍රගතිය විමසා සිටි ගරු නාගරික මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමන් විසින් නගරයේ , විදුලි කණු පිරිසිදු කිරීම ඉතා යහපත් ක්‍රියාවක් බවත් ඒවායෙහි කොළ වර්ණය ආලේපිත කිරීම වෙනුවට කහ හෝ තැඹිලි වර්නය ආලේප කිරීම සුදුසු බවත් පෙන්වා දෙන ලදී.

මහජන පොල අප්‍රේල් මස 11 හා 12 දෙදින පැවැත්වීමේදී එක් දිනකට පමණක් ගාස්තු අයකරන මෙන් එහි වෙලඳුන්ගෙන් ඉල්ලීමක් ඇති බවත් ඒ පිළිබඳව සභාවේ අවධානය යොමු

කරන ලෙසත් , පොළ භූමියේ බිම එළවළු වෙළඳාමේ නිරත වෙළඳුන් එම ස්ථානයෙන් ඉවත් නොකරන ලෙසත් ඉල්ලා සිටි ගරු නාගරික මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ඔවුනට නීතිමය ක්‍රියාමාර්ග නොගන්නා ලෙස මහජන සෞඛ්‍යය පරීක්ෂකවරයා දැනුවත් කරන මෙන්ද ඉල්ලා සිටින ලදී.

පසුගිය මස සභා වාරයේදී ශෛලතලාරාම මාවත අළුත්වැඩියා කර දෙන මෙන් තමන් විසින් ඉල්ලා සිටි බව පැවසූ ගරු නාගරික මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමන් විසින් සභා අරමුදල් යොදවා කිරිදිගල කොට්ඨාශයේ කරනු ලබන සංවර්ධන කාර්යයන්, තම පෞද්ගලික අරමුදලින් කරන්නාක් මෙන් හුවා දක්වමින් බැනර් ප්‍රදර්ශනය කිරීමේ තත්වයක් හා ෆේස් බුක් වැනි සමාජ මාධ්‍ය හරහා ප්‍රසිද්ධ කිරීම දක්නට ලැබෙන බවත් එවන් කාර්යයන් අනුන්ගේ ළමයින්ට උප්පැන්න සකස් කිරීමක් වැන්නක් බවත් පවසා සිටින ලදී.

දොරවෙළ තුරු උයන ආදායම් උත්පාදන ව්‍යාපෘතියක් ලෙස සංවර්ධනය කිරීම යහපත් කාර්යයක් බවත්, එය තම කොට්ඨාශයේ සංවර්ධන කාර්යයක් බැවින් කොට්ඨාශයේ මැතිවරණය ජයග්‍රහණය කල මන්ත්‍රීවරයා ලෙස එම සංවර්ධන කාර්යයන්හිදී තමන්ව දැනුවත් කරන ලෙසත් පවසා සිටි ගරු නාගරික මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ෆේස් බුක් හරහා ජනප්‍රිය දේශපාලනය නොව නියම ජනතා සේවය සිදු කිරීම තම අභිප්‍රාය බවත් 2020 දී එය ඉටුකරගැනීමට හැකිවනු ඇතැයි අපේක්ෂාවෙන් සිටින බවත් පවසා සිටින ලදී.

**<u>ගරු නාගරික මන්ත්‍රී කේ.පී.පේමදාස මැතිතුමා</u>**

ගරු නාගරික මන්ත්‍රී කේ.පී.පේමදාස මැතිතුමන් විසින් අදහස් දක්වමින් සභාව වෙත එක් වරක් ඉදිරිපත් කරන ලද යෝජනාවක් නැවත මාස 6ක් ගතවන තුරු ඉදිරිපත් කිරීමට නොහැකි බවත්, සභා නීති රීති සම්බන්ධ වාර්තා අධ්‍යයනය කර අවබෝධයක් ලබා ගන්නේ නම් මෙවැනි අපහසුතා සිදු නොවන බවත් පවසා සිටි අතර ෆේස් බුක් වැනි සමාජ මාධ්‍ය හරහා ප්‍රසිද්ධ වීමට දේශපාලන කටයුතු ප්‍රචාරය කලද ඉන් මැතිවරන ජයග්‍රහණ කිරීමට නොහැකි බවද පවසා සිටින ලදී.

අධ්‍යාපන සුදුසුකම් පමණක්ම නොව, දේශපාලනය කිරීම සඳහා වඩාත් අවැසි වන්නේ කැපවීම හා සමාජ අවබෝධය බව පවසා සිටි ගරු නාගරික මන්ත්‍රී කේ.පී.පේමදාස මැතිතුමන් විසින් ඒ සම්බන්ධව උදාහරන දක්වමින් පැහැදිලි කරන ලදී.

වැඩිදුරටත් අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී කේ.පී.පේමදාස මැතිතුමන් විසින් සභාවේ සියළු දෙනා පොදුවේ මහජනතාවගේ දුක් ගැනවිලි සම්බන්ධයෙන් කටයුතු කල යුතු බවත් , යෝජනා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් සදාචාර සම්පන්න විය යුතු බවත් පවසාසිටි අතර මෙදින සභාව වෙත තමන් විසින් යෝජනා ඉදිරිපත් නොකල බවද පවසා සිටින ලදී.

## <u>ගරු නාගරික මන්ත්‍රී අකිල සාළිය එල්ලාවල මැතිතුමා</u>

ගරු නාගරික මන්ත්‍රී අකිල සාලිය එල්ලාවල මැතිතුමන් විසින් අදහස් දක්වමින් හිටපු ගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමන්ගේ බලංගොඩ සම්ප්‍රාප්තිය වෙනුවෙන් වැලිහරනාව වටරවුම් මාර්ගය කඩිනමින් සංවර්ධනය කිරීම සම්බන්ධව ගරු සභාපතිතුමා ප්‍රමුඛ ඊට දායකත්වය සැපයූ සියළුදෙනාට ස්තූතිවන්ත වන බව පවසා සිටින ලදී.එමෙන්ම කාර්යය සාධන තරඟාවලියේ ජයග්‍රහණය උදෙසා සුභ පැතුම් එක්කරන බවත්,ලකුණු ප්‍රමාණයේ අඩුවීමක් දක්නට ඇති හෙයින් වැඩි ලකුණු ප්‍රමාණයක් ලබාගෙන ජයග්‍රහනය කිරීමට කටයුතු කල යුතු බවත් පවසා සිටින ලදී.
ඉවත් කරන ලද පදික වෙළදුන් සම්බන්දව අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී අකිල සාලිය එල්ලාවල මැතිතුමන් විසින් ඔවුන් මේවන විට කිසිදු වෙළදාමක් නොමැතිව අසරන වී සිටින බවත්, මානුෂික වශයෙන් සිතා බලා අළුත් අවුරුදු සමයේ පදික වෙළදාම සිදුකර ගැනීමට දින 3ක වැනි කාල සීමාවක් ලබාදෙන ලෙසත් පවසා සිටින ලදී.

සිංහල හින්දු අළුත් අවුරුදු සමයේ පාසල් 6 ක ආදි ශිෂ්‍යයන් එකතු වී සිදුකිරීමට නියමිත අළුත් අවුරුදු උත්සවය සඳහා මූලිකත්වය ගෙන සිටින්නේ මුස්ලිම් සහෝදරවරු පිරිසක් බවත් සංහිදියාව සඳහා එය ඉතා ආදර්ශමත් ක්‍රියාවක් බව පවසා සිටින ලදී.

සභාවට ඉදිරිපත් කරන සංවර්ධන යෝජනා සම්බන්ධවද අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී අකිල සාලිය එල්ලාවල මැතිතුමන් විසින් මැතිවරණයෙන් පසුව සියළුදෙනා ජනතා සේවකයන්

බවත්, මහජනතාව සඳහා සංවර්ධන කාර්යයන් ඉටුකර දීම සඳහා මුදල් සොයා ගැනීමට සුදුසු ක්‍රමවේදයන් සකස්කර ගත යුතු බවත්,ඒ සඳහා ගරු ආණ්ඩුකාරතුමා හමුවී මුදල් ලබාගැනීම, හිටපු සභාපතිතුමන්ගේ අත්දැකීම්වල සහය ගැනීම වැනි දෑ ක්‍රියාවට නංවන ලෙසත් පවසා සිටින ලදී. එසේ නොමැති වුවහොත් මන්ත්‍රිවරුන්ට දේශපාලනය කිරීම සඳහා ගමට යා නොහැකි තත්වයක් උදාවනු ඇතැයි පවසා සිටි ගරු නාගරික මන්ත්‍රී අකිල සාලිය එල්ලාවල මැතිතුමා මේ සම්බන්ධව කාරුණික අවධානය යොමුකරන ලෙස වැඩිදුරටත් පවසා සිටින ලදී.

--

**ගරු සභාපතිතුමන් විසින් මෙහිදී අදහස් දක්වමින්,පදික වෙළඳුන් හට තොග වෙළෙඳ මධ්‍යස්ථානයේ ඉදිරි කොටස වෙළදාම් කටයුතු කරගැනීම සඳහා ලබාදීමට ඉඩකඩ ලබාදී ඇති බව පවසා සිටින ලදී.**

<u>**ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා**</u>

සබරගමුව පළාතේ කාර්යය සාධනය ඇගයීම වෙනුවෙන් බලංගොඩ නගර සභාව ප්‍රථම ස්ථානය ලබා ගැනීම වෙනුවෙන් ඒ හා සම්බන්ධ වී ක්‍රියාකල සියළු දෙනාට ස්තුතිවන්ත වීමට මෙය අවස්ථාවක් කර ගන්නා බව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන් විසින් පවසා සිටින ලදී. ආදි ශිෂ්‍ය සංගම් එකමුතුව විසින් පැවැත්වීමට නියමිත අවුරුදු උත්සවයට පෙර ක්‍රීඩාංගනය යම් ආකාරයකට ක්‍රමානුකූල කල යුතු බවත්, ප්‍රේක්ෂකාගාරය තීන්ත ආලේප කොට අළුත් වැඩියා කොට ,වැසිකිළි දෙක සකස් කර , කාමර දෙකෙහි ඉබි යතුරු සකස් කර දිය යුතු බවත්, සභාව කඩිනමින් මැදිහත් වී ප්‍රේක්ෂකාගාරය සඳහා පුටු 25 ක් වත් ලබාදීමට කටයුතු කිරීම සුදුසු බවත් පවසා සිටින ලදී.

මෙහිදී තව දුරටත් අදහස් දැක්වූ ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමන් විසින් සෑම නාගරික මන්ත්‍රිවරයෙකුම තම කොට්ඨාශය සංවර්ධනය සඳහා මුදල් ලැබේයැයි අපේක්ෂා කරන බවත් ගම්පෙරලිය වැනි සංවර්ධන යෝජනා ක්‍රම හරහා ලැබී ඇති මුදල් ප්‍රතිපාදන සියළු මන්ත්‍රිවරුන්ගේ යහපත් සංවර්ධන යෝජනා සඳහා යොමුකිරීමට සහයෝගය දක්වන ලෙසත් ගරු සභාපතිතුමන් ස්වාධීන පුද්ගලයෙක් ලෙස සියළු මන්ත්‍රිවරුන් රැකගනිමින් ඔවුන් ශක්තිමත් කිරීමට සහය දක්වන ලෙසත් මෙහිදී ඉල්ලා සිටින ලදී.

එමෙන්ම ගරු නාගරික මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමන් විසින් පැවසුවාක් මෙන්, සභාවේ බදු ගෙවන ජනතා මුදලින් සිදු කරන ලද සංවර්ධන යෝජනා සඳහා බැනර් ප්‍රදර්ශනය කරමින්,සමාජ මාධ්‍ය ජාලා ඔස්සේ ප්‍රසිද්ධ කිරීම අනවශ්‍යය ක්‍රියාවළියක් බවත්, කොට්ඨාශයක සංවර්ධන කාර්යයන් සිදු කිරීමේදි එම කොට්ඨාශයට අයත් මන්ත්‍රීවරයා දායක කොට ගෙන සිදු කිරීම සුදුසු බවත් පවසා සිටින ලදී.

වැවවත්ත උද්‍යානයේ කාණු පද්ධතියේ ජලය එක්රැස් වීම හේතුවෙන් ඩෙංගු රෝගය ව්‍යාප්ත වේ යැයි අවදානම් තත්වයක පවතින හෙයින් මේ පිලිබඳව ගරු සභාවේ කඩිනම් අවධානය යොමු කල යුතු බව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමන් විසින් පවසා සිටින ලදී.

<u>ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා</u>

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමන් විසින් අදහස් දක්වමින්, ලබන්නා වූ සිංහල හින්දු අළුත් අවුරුද්ද සැමට සුභ නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරමින් අදහස් දක්වා සිටි අතර සභාවේ රැස්වීම් සඳහා ක්ෂනිකව කථාකල විට පැමිණීමේ අපහසුතාවයක් පවතින හෙයින් රැස්වීම් සඳහා කළින් දන්වා එවන ලෙස පවසා සිටින ලදී.

සබරගමුව පළාත් කාර්යය සාධන තරඟයෙන් බලංගොඩ නගර සභාව ප්‍රථම ස්ථානය ලබාගැනීම පිළිබඳව අදහස් දක්වා සිටි ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමන් විසින්, ලකුනු ප්‍රමාණය අඩුවීමක් දක්නට ලැබීම පිළිබඳව කනගාටුවට පත්වන බවත්, තම පාලනය කාලය විශාල ලෙස ලකුණු රැස්කර ගනිමින් කාර්යය සාධන ඇගයීමෙන් හා ඵලදායිතාවය තුලින් ජයග්‍රහණ රාශියක් හිමිකරගත් බවත්, විදේශයන්හි පවා සම්මානයට පාත්‍ර වීමට හැකියාව ලැබුන ආකාරය පිළිබඳවත් පවසා සිටින ලදී.

බලංගොඩ මැතිවරණය සඳහා ඉදිරිපත් වී පරාජයට පත්වූ අයෙක් විසින් ෆේස් බුක් සමාජ මාධ්‍ය හරහා බලංගොඩ නගර සභාවේ සභිකයන්ගේ අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ විමසා ඇති බවට සභාවට කරුණු ඉදිරිපත් කල ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමන් විසින් එවැනි ගැටළුවලට වඩා පිළිතුරු අපේක්ෂිත ගැටළු මහජනයා සතුව පවතින බව එවන් ක්‍රියා හෙළා දකිමින් පවසා සිටින ලදී.

තොග වෙළෙඳ මධ්‍යස්ථානයේ පදික කඩ වෙළඳුන්ට වෙළදාමේ නිරත වීමට ඉඩ ලබාදෙන ලෙස පවසා සිටි ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමන් විසින්, සභාව විසින් දේශීය මූල්‍ය අරමුදල වෙත ගෙවීමට ඇති ණය මුදල සම්බන්ධව 2002 වර්ෂයේ සිටි සභාව හා නිළධාරීන් වගකිව යුතු බවත්, එවකට සිටි සභාපතිවරයා කාණු පද්ධතිය භාර නොගත් අතර,බස් නැවතුම්පොල වැඩ අවසන් කිරීමෙන් අවුරුද්දක පමණ කාල සීමාවක් යන තෙක් වසා තිබූ බවත් පවසා සිටින ලදී. කෙසේ නමුදු විශාල ණය මුදලක් සමඟ සභාවේ කාර්යයන් කරගෙන යාමේ අපහසුතාවයක් පවතින බව තේරුම් ගත හැකි බවද මෙහිදී පවසා සිටින ලදී.

වැය ශීර්ෂය හා අයවැය පිළිබඳව අදහස් දක්වමින් එය කිසිවිටෙකත් පරාජය කිරීම කල නොහැක්කක් බවත්,ඉන් වැය ශිර්ෂ 4 ක් අතිගරු ජනාධිපතිතුමන්ගේ වන අතර කවුරුන් කෙසේ පැවසුවද රජයේ නායකයා වන්නේ අතිගරු ජනාධිපතිතුමා බවත් ප්‍රකාශ කරනලදී.
වර්ෂ අවසානයේ සංවර්ධනයන් සඳහා මුදල් ලබාදෙන බව පැවසුවද එවන්නක් සිදු නොවූ බවත්,ගරු ආණ්ඩුකාරතුමන් විසින් අවිච්ඡේද ගෙවීමටවත් මුදල් ප්‍රමානවත් නොවන බව පවසා සිටි අයුරු සැලවූ බව පවසා සිටි ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමන් විසින්, ආර්.කේ.ගුණපාල මහතාගේ ඉල්ලීමට සාධාරණයක් ඉටුකර දෙන ලෙසත්, නීතිඥ්‍ය දේශබන්ධු මහතාගේ නිවසට යන මාර්ගය සකස් කර දීම සම්බන්ධව සභාවේ අවධානය යොමුකරන ලෙසත්, උසාවි දඩ මුදල් ලබාගැනීම සම්බන්ධයෙන් අවධානය යොමුකරන ලෙසත් පවසා සිටින ලදී.

<u>ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය</u>

ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින් අදහස් දක්වමින් කාර්යය සාධන තරඟයේ ජයග්‍රහනය උදෙසා රන් සම්මානය දිනා ගැනීම සම්බන්ධව සුභ පතන අතරම නවක මහජන නියෝජිතයන් වශයෙන් එම අවස්ථාවට සම්බන්ධ වීමට ලැබීම ආඩම්බරයක් සේ සලකන බවත් පවසා සිටින ලදී.
කර්මාන්ත අංශයේ වැඩ කටයුතු කඩිනම් වීම සම්බන්ධයෙන් කර්මාන්ත කමිටුවේ සභාපති එම්.ඩබ්.විමළසිරි මැතිතුමන්ට ස්තුතිවන්ත වන බව පවසා සිටි ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින් ලයිස්තුවෙන් නගර සභාව වෙත පත්වූ බව පවසමින් විවිධ කථා

පැවසුවද ඒයේ පෙරේදා දේශපාලනය වෙත ආවා නොව තම පියාද දේශපාලන ක්ෂේත්‍රයේ සිටි අතර තමන් විසින්ද දේශපාලන විද්‍යාව හදාරා ඇති බව පවසා සිටින ලදී.

ගරු අධිකරණ අමාත්‍යතුමිය තළතා අතුකෝරාල මැතිණිය විසින් තමන්ව නගරයේ සිටින නාගරික මන්ත්‍රිවරියක් ලෙස නගරයේ තිබෙන සංවර්ධන කාර්යයන් පිළිබඳව සොයා බැලීමට නම්කර ඇති බවත් එතුමිය එම කාර්යයන් සඳහා මුදල් වෙන් කර ඇති බවත් පවසා සිටි ගරු නාගරික මන්ත්‍රි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින් ඡන්ද පදනම සකස් කර ගැනීමට වඩා නගරයේ සංවර්ධනය පිළිබඳව අවධානය යොමු කිරීම වැදගත් බවත් පවසා සිටින ලදී.ඒ වෙනුවෙන් ගරු අධිකරණ අමාත්‍යතුමිය තළතා අතුකෝරාල මැතිණියට ස්තූතිවන්ත වන බව පැවසූ නාගරික මන්ත්‍රි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින් වරක් ඉදිරිපත් කල යෝජනාවක්,මාස 6ක් යනතුරු නැවත ඉදිරිපත් කල නොහැකි වීම පිළිබඳව තමන් දැනුවත් නොවූ අතර ඒ සඳහා කනගාටුව පල කරන බව පවසන ලදී.

නම්, බෝඩ් ,පුවරු ගසාගෙන දේශපාලනය කිරීම අනවශ්‍ය බවත් ජනතාවට නියමානුකූලව සේවය කිරීම වඩා වැදගත් බවත් පවසා සිටි ගරු නාගරික මන්ත්‍රි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය ලබන්නාවූ සිංහල ,හින්දු අළුත් අවුරුද්ද සියළු දෙනාට සුබ අළුත් අවුරුද්දක් වේවායි ප්‍රාර්ථනා කරමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**<u>ගරු නාගරික මන්ත්‍රි එම්.ඩබ්.විමලසිරි මැතිතුමා</u>**

ගරු නාගරික මන්ත්‍රි එම්.ඩබ්.විමලසිරි මැතිතුමා අදහස් දක්වමින් කරවිකැටිය මාර්ගය,කොටුගොඩැල්ල මාර්ගය,දෙවැට පාර ආදී බොහෝ මාර්ගයන්හි සංවර්ධන කටයුතු නිමාකල ඇති බවත් තිබෙන සම්පත් උපයෝගි කොට ගෙන අවශ්‍යතාවය අනුව ප්‍රමුඛත්වය ලබාදෙමින් එම කටයුතු සිදු කරන බවත් මේ අයුරින් 2020 වර්ෂය වන විට ඉහළ වැඩ කොටසක් සිදු කිරීමට හැකිවනු ඇතැයි අපේක්ෂා කරන බවත් පවසා සිටින ලදී.

මෙහිදී සියළු නාගරික මන්ත්‍රිවරුන්ගේ අදහස් හා යෝජනා පිළිබඳව සහාය දක්වන බව පවසා සිටි ගරු නාගරික මන්ත්‍රි එම්.ඩබ්.විමලසිරි මැතිතුමා බලංගොඩ ආසනයේ සංවර්ධනය සඳහා විශාල මුදල් ප්‍රමාණයක් ලැබී තිබෙන බවත්, පානීය ජලය ලබාදීම සඳහාද ප්‍රතිපාදන ලැබී ඇති බව පවසා සිටින ලදී.

තව දුරටත් අදහස් දක්වූ ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමන් විසින් පෙට්ටිගල මාර්ගයේ මාර්ග සංවර්ධන අධිකාරියට අයත් කොටසේ වල් බිහිවී, කාණු ගොඩවී ඇති නිසා එම කොටස ශුද්ධ පවිත්‍ර කරන ලෙස මාර්ග සංවර්ධන අධිකාරිය දැනුවත් කොට ලිපියක් යවන මෙන් පසුගිය සභාවාරයේදී තමන් විසින් පවසා සිටි බවත් මේවන තෙක් එය ක්‍රියාවට නංවා නොමැති නම් ලිපියක් සකස් කර යවන ලෙසත් පවසා සිටින ලදී. එමෙන්ම තමන් විසින් සභා වාර කීපයකදී පැවසුවාක් මෙන් කසළ ට්‍රැක්ටරය ගමන් කල හැකි මාර්ගයන්හි කසළ ට්‍රැක්ටර් ධාවනය නොවීම සම්බන්ධව ගරු සභාවේ අවධානය යොමු කරන ලෙස නැවත වරක් සිහිපත් කරන බව පවසා සිටින ලදී.

ලබන්නා වූ සිංහල හින්දු අළුත් අවුරුද්ද සියළු දෙනාට වාසනාවන්ත සුභ නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරමින් ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමන් විසින් සිය අදහස් දැක්වීම අවසන් කරන ලදී.

<u>ගරු නාගරික මන්ත්‍රිනි එම්.ශාන්තිලේඛා මැතිතුමිය</u>

වසර ගණනාවක් තිස්සේ කරන ලද යෝජනාවක් සාර්ථක වෙමින් අද වන විට බලංගොඩ නගරයට අතිරේක දිසා මහේස්ත්‍රාත් අධිකරණයක් ලැබී තිබීම ඉතා සතුටට කරුණක් බවත් ඒ වෙනුවෙන් ගරු අධිකරණ අමාත්‍ය තළතා අතුකෝරාළ මැතිනියට ස්තුතිවන්ත වන බවත් පවසා සිටි ගරු නාගරික මන්ත්‍රී එම්.ශාන්තිලේඛා මැතිතුමිය විසින් කම්කරු විනිශ්චය සභාව නැවත බලංගොඩ නගරයේ ස්ථාපිත කිරීම සම්බන්ධවද ගරු අමාත්‍යතුමියගේ අවධානයට යොමු කිරීම සුදුසු බව පවසා සිටින ලදී.

තව දුරටත් අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී එම්.ශාන්තිලේඛා මැතිතුමිය විසින් තමන් විසින් ඉදිරිපත් කරන ලද සංවර්ධන යෝජනා අතරින් කීපයක් හෝ ඉටුකර දෙන මෙන් පවසා සිටි අතර, ගම්පෙරළිය ව්‍යාපෘතිය යටතේ ලැබීමට නියමිත මුදල් ප්‍රතිපාදන පිළිබඳව පැහැදිලි කිරීමක් සිදු කර දෙන ලෙසත්,සභාව පිහිටුවීමට තම පක්ෂයේ සහයෝගය ගත් ලෙසින් ප්‍රතිපාදන වෙන් කිරීමේදි ප්‍රතිපාදන ලබාදීමක් සිදු වන්නේ නැද්ද යන්න පිළිබඳව විමසා සිටින ලදී. ජනතාව අපේක්ෂා කරන සේවය ලබාදීම සඳහා ඒ පිළිබඳව ගරු සභාවේ අවධානය යොමුකරන ලෙස මෙහිදී පවසා සිටින ලදී.

**<u>ගරු නාගරික මන්ත්‍රිනි පී.චන්ද්‍රලතා මැතිතුමිය</u>**

ගරු නාගරික මන්ත්‍රිනි පී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් අදහස් දක්වමින්, සභාව වෙතින් කරන ලද ඉල්ලීම්වලදී ඒ සඳහා සහයෝගය නොමඳව ලැබුන බව පවසා සිටි අතර, කෝපිවත්ත කාණු පද්ධතිය ගොඩ වී ඇති අයුරු දක්නට ලැබුන බවත්, කම්කරුවන් නිසියාකාරව තම කාර්යයන්හි නිරත නොවීම නිරීක්ෂනයට ලක් වී ඇති නිසා මේ සම්බන්ධව අධීක්ෂනය කිරීම සිදු කල යුතු බවත් පවසා සිටින ලදී .

සභාවට යෝජනා ඉදිරිපත් කිරීමේදී එක් අයෙකු ඉදිරිපත් කරන ලද යෝජනාවක් තවත් අයෙක් මාස 6ක් නොඉක්මවා සභාවට ඉදිරිපත් කිරීම වැරදි නමුත් රණවිනාවත්ත ජල යෝජනා ක්‍රමය පිළිබඳව තමන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු නාගරික මන්ත්‍රි කවිරත්න මැතිතුමන් විසින් ඉදිරිපත් කල අවස්ථාවේ තමාද ඉතා කනගාටුවට පත් වූ බවත් තම කණ්ඩායම් නායක ගරු නාගරික මන්ත්‍රි අකිළ සාළිය එල්ලාවල මැතිතුමන් විසින් කවුරුන් සිදු කලද ජනතා සේවය සිදුවේ නම් සතුටු වන ලෙසින් ලබාදුන් උපදෙස් අනුව තමන් ක්‍රියාකල බවත් පවසා සිටින ලදී.

කසළ ප්‍රශ්නය තමා විසින් පලමු සභා වාරයේ සිටම ඉදිරිපත් කල යෝජනාවක් වන අතර,මෙම ගැටළු විසඳීම සඳහා කොට්ඨාශ වශයෙන් කමිටු පිහිටුවීම ඉතා වැදගත් කාර්යයක් වන අතර ඒ සම්බන්ධයෙන් සතුටට පත්වන බවත් පවසා සිටින ලදී.

එමෙන්ම පසුගිය වර්ෂයේ ලබාදෙන ලද පුද්ගලික මන්ත්‍රි ප්‍රතිපාදන තුළින් සෙවිලි සහනාධාර හා වැසිකිළි ආධාර ලබාදීමට හැකියාව ලද අතර මෙම වර්ෂයේද එලෙස කොට්ඨාශ වශයෙන් ප්‍රතිපාදන ලබාදීම පිලිබඳව සලකා බලන ලෙස ඉල්ලා සිටින ලදී.

ගරු නාගරික මන්ත්‍රිනි පී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් අදහස් දක්වමින් හුණුකුඹුර, දෙල්ගස්වත්ත මාර්ගයේ රොෂාන් මහත්මාගේ නිවෙසේ සිට ඉහළට මීටර් 100 ප්‍රමාණයකට කොන්ක්‍රීට් කිරීම සඳහා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන්

මුදල් ලබා ගැනීමේ හැකියාවක් පවතින බැවින් ඒ සඳහා අවශ්‍ය ඇස්තමේන්තු සභාව විසින් සකස් කර දෙන මෙන් ඉල්ලා සිටි අතර පොළ භූමියේ වැසිකිළිය ඉදිරිපිට මළ අපද්‍රව්‍යය නිසා කාණු පද්ධතිය අවහිර වී මහජනයා විශාල පීඩාවකට ලක්ව ඇති බවත් ඒ සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කරන ලෙසත් පවසා සිටිනලදී.

**<u>ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා</u>**

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමන් විසින් අදහස් දක්වමින් කාර්යය සාධන රන් සම්මානය ලබාගැනීම උදෙසා ගරු සභාපතිතුමන් ඇතුළු කාර්යය මණ්ඩලයට සුභ පැතීමට මෙය අවස්ථාවක් කර ගන්නා බව පවසාසිටි අතර බලංගොඩ නගර සභාව වෙත ගිනි නිවන රථය ලබාදීමට පුරෝගාමියා වූ ශ්‍රී මුහුන්දන් මැතිතුමාගේ අභාවය වෙනුවෙන් ශෝකය පල කරන බවත් නගර සභාව විසින් එතුමාගේ පවුලේ සාමාජිකයන් වෙත ශෝක ප්‍රකාශයක් යැවීම සඳහා කටයුතු කරන ලෙසත් පවසා සිටින ලදී.

විදුලි කණුවල කොළ වර්ණය ආලේප කිරීම සම්බන්ධයෙන් අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමන් විසින් මේ සඳහා සම්මත වර්ණයක් පවතින බවත් ,තමන් විසින් විදේශයක සිටින යහළුවෙකුගෙන් ද මේ සම්බන්ධව විමසා තහවුරු කර ගත් බවත් ඒ සඳහා සුදුසු වර්ණය භාවිතා කරන ලෙසත් උපදෙස් ලබාදෙන ලදී.

එමෙන්ම රථවාහන සාකච්ඡාවේදි කතිකා කරගත් පරිදි අප්‍රේල් 10,11,හා 12 යන තෙදින වාහන ගාල් කිරීම සඳහා ක්‍රීඩාංගනය පෙදෙසට යෙදවීම සම්බන්ධයෙන් ද, මොහාන් සාලිය එල්ලාවල මාර්ගයේ ගල්වල ඉදිරිපිට කහඉර අවසන් වන ස්ථානයේ බස් රථ නැවතුම් ස්ථානයක් සකස් කිරීමට පාර මැද රවුමක් ලකුණු කිරීමට හා පෙට්ටිගල මාර්ගයට හැරෙන ස්ථානයේ බස් රථ නැවතුම් ස්ථානයක් සකස් කිරීමට පාර මැද රවුමක් ලකුණු කිරීම සුදුසු බවත්, සභාපතිවරයාගේ නම පාවිච්චි කරමින් ත්‍රිවීල් නැවතුම්පළවල් සකස් කරගෙන තිබීම සම්බන්ධයෙන් ගරු සභාවේ අවධානය යොමු කරන ලෙස මෙහිදී පවසා සිටින ලදී.

එමෙන්ම වාහන ප්‍රමාණය වැඩි වීමට සාපේක්ෂව වාහන නතර කිරීම තහනම් පුවරුද වැඩිවීම සම්බන්ධයෙන් විසඳුමක් අවශ්‍ය බව පවසා සිටි ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමන් මේ සඳහා එකම විකල්පය ක්‍රීඩාංගණය අසළ වාහන නැවතුම් ස්ථානයක් සකස් කිරීම බවත් පල්ලිය මාර්ගයේ පුද්ගලික බස්රථ උදේ සිට සවස් වන තුරු මාර්ගය දෙපස ගාල් කර, බස් රථ සේදීම වැනි කාර්යන්හි යෙදීම නිසා අවහිරතා ඇති වන බැවින් ඒ සම්බන්ධව ක්‍රියා මාර්ගයක් ගත යුතු බවත් පවසා සිටින ලදී.

තවදුරටත් අදහස් දක්වූ ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමන් විසින් ,විද්‍යාලෝක පාසල ඉදිරිපිට කොන්ක්‍රීට් ස්ලැබ් නැති කොටස පිලිබඳ අවධානය යොමු කරන ලෙසත්, අළුත් අවුරුදු උත්සවයට පොරොතුව ළඳරු උයන ළඟ සංවර්ධනය කරදීම සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙසත් පවසා සිටි අතර,අබුසාලි මාවත හා පූජ්‍යදාස තේනුවර මාවත නමින් මාර්ග නම්කිරීම සම්බන්ධයෙන් ප්‍රගතිය විමසා සිටින ලදී.

එක් සභිකයෙක් විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවක් මාස 6ක් ඉක්මවන තුරු තවත් සභිකයෙක් විසින් ඉදිරිපත් කිරීම නොකල යුතුයි යන්නට සියළු දෙනා ගරු කල යුතු බව පවසා සිටි ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමන් විසින් අදාළ කොට්ඨාශයේ සංවර්ධන කටයුතු කිරීමේදි එම කොට්ඨාශයේ මන්ත්‍රීවරයා දැනුවත් නොකිරීම සම්බන්ධව විරෝධය දක්වන බවත්, ආදි ශිෂ්‍ය සංගම් එකමුතුව විසින් පැවැත්වීමට නියමිත අවුරුදු උත්සවය සඳහා ප්‍රදර්ශනය කරන ලද බැනර් එක කපා දැමීම සම්බන්ධයෙන්ද විරෝධය දක්වන බවත්, මෙහිදී පවසා සිටින ලදී.

බස්නැවතුම්පොළ ගොඩනැගිල්ලේ පඩිපෙළ නිරන්තරයෙන් අපිරිසිදු වන බැවින් එය බලාගැනීමේ වගකීම පඩිපෙළ ඉදිරිපිට කඩහිමියන්ට පැවරීම සුදුසු බවත්, නගරයේ නඩත්තු කටයුතු සම්බන්ධයෙන් කටයුතු කිරීමේදි අර්ජුන මහතාගේ නිවස පාර,දංගමුව වලව්ව පාර පිළිබඳව අවධානය යොමුකරන ලෙසත්,සේනක පෙදෙසේ මාර්ගය මැද ඇති විදුලි කණුව මාර්ගය අයිනකට කිරීම සම්බන්ධව අවධානය යොමු කරන ලෙසත් පවසා සිටි ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමන් විසින් ලබන්නා වූ අළුත් අවුරුද්ද සැමට සුභ නව වසරක් වේවායි පවසා සිටින ලදී.

**ගරු නාගරික මන්ත්‍රී ජුනයිදීන් මාලික්ෂා මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී ජුනයිදීන් මාලික්ෂා මැතිතුමන් විසින් අදහස් දක්වමින්, නගරයේ මාර්ග සම්බන්ධව කර්මාන්ත කමිටුවේ මැදිහත් වීම වෙනුවෙන් ස්තුතිවන්ත වන බවත්,ගම්පෙරලිය වැඩ සටහන යටතේ රත්නපුර දිස්ත්‍රික්කය සඳහා වෙන් කරන ලද මුදලින් වැඩි මුදල් ප්‍රමාණයක් වෙන් කර ඇත්තේ බලංගොඩ එ.ජා.ප. මන්ත්‍රීවරුන්ට වීම සුවිශේෂී වන අතරම ඒ සම්බන්ධව ගරු අධිකරණ අමාත්‍ය තළතා අතුකෝරාල මැතිතුමියට ස්තුතිවන්ත වන බව පවසා සිටින ලදී.

බලංගොඩ පොදු වෙළෙඳ සැළ සංවර්ධනයෙන් පසුව බස්නැවතුම්පොළ සංවර්ධනය සම්බන්ධයෙන් සභාවේ අවධානය යොමු කල යුතු බව පවසා සිටි ගරු නාගරික මන්ත්‍රී ජුනයිදීන් මාලික්ෂා මැතිතුමන් විසින් 2019 වර්ෂය ඡන්ද වසරක් බවත් ,ජාතික නායකයන් කිසිවෙකු විවේචනය කිරීමට අකැමති බවත් සියළු දෙනා රට වෙනුවෙන් සේවය කරන ලද්දන් බවත් , කෙසේ නමුත් 2020 වර්ෂයේ එ.ජා.ප. ආණ්ඩුවක් සාදන බවත් සැම විටම හොඳ දේ අගය කිරීමට හා හොඳ දෙයට සහය දීමට බැදී සිටින බවත් පවසමින් ලබන්නා වූ අළුත් අවුරුද්ද සාමය ,සතුට සපිරි සුභ නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා**

එක් අයෙක් කථාකරන විට අනෙක් අය එම කථාව ඇසෙන පරිදි නිහඩව සිටින පරිද්දෙන් හැසිරිය යුතු බව පැවසූ ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමන් විසින් ජාතික ඡන්දයක් පිළිබඳ කථා කලද ගමේ පොඩි සංවර්ධනයක් හෝ සිදු නොකර අවංකව ජාතික දේශපාලනයක් සම්බන්ධව කථා කල නොහැකි බවත්,ගම්පෙරළිය යටතේ විශාල වැඩ කොටසක් සිදු කිරීමට අපේක්ෂා කරන බව ගරු නාගරික මන්ත්‍රී ජුනයිදීන් මාලික්ෂා මැතිතුමන් විසින් පැවසුවද ආණ්ඩුව විසින් හම්බන්තොට වරාය විකුණා ගම්පෙරලිය සඳහා මුදල් සොයා ගත් බවත් පවසා සිටින ලදී.

ජනතා විමුක්ති පෙරමුණ හැරුනු කොට ගෙන රටේ කිසිදු දේශපාලන පක්ෂයක සමගියක් නැති බැවින් දේශපාලන අර්බුද උග්‍ර වී ඇති බවත් සැම දිනකම දේශපාලන ජයග්‍රහණ ලබාගනුයේ දේශපාලන කුමන්ත්‍රණ තුළින බවත්,රට විශාල වශයෙන්

අස්ථාවර වීමක් දක්නට ලැබෙන බවත් ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමන් විසින් පවසා සිටින ලදී.

"ගුල්ලෝ සෙල්ලම් දාන්නේ බාල ලෑලිවල" යන්න පවසා සිටි ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමන් විසින් වර්ෂ අවසානයේ සභාවේ බලය තම පක්ෂයේ අතට ගැනීමට අපේක්ෂා කරන බවත් එවිට තමන්ට බෙදූ හැද්දෙන්ම අනෙකුන් වෙත බෙදීමට පසුබට නොවන බවත් පවසා සිටින ලදී.

1997 වර්ෂයේ සිට හිටපු සභාපතිතුමන්ගේ දක්ෂතාවය අනුව සභාව යම් තැනකට ඔසවා තැබීමට හැකි වූ බව පවසා සිටි ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර මැතිතුමන් විසින් එතුමා අමාත්‍යවරුන් හමුවී සංවර්ධනය සඳහා මුදල් උපයාගත් බව පවසා සිටි අතර, සභාවට ලැබෙන ආදායම් මාර්ග උපයෝගි කොට ගෙන ණය ගෙවා සභාවේ කටයුතු ඉදිරියට ගෙන යා යුතු බව පවසා සිටින ලදී.

තව දුරටත් අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමන් විසින් කර්මාන්ත කමිටුවේ යම් දියුණුවක් දක්නට ලැබෙන බවත්, ජනතාහිතවාදී වැඩපිලිවෙලක් ක්‍රියාත්මක වන බව දක්නට ලැබෙන බවත් පවසා සිටි අතර, නගරයේ විදුලි කණුවල කොල වර්ණය ආලේප කිරීම සම්බන්ධයෙන් අදහස් දක්වමින් කොළ වර්ණය ආලේප කරන්නේ නිවාසවල තාප්පයන් ආදියේ බවත්, එනම් එය මැස්සන්ට කියවිය නොහැකි වර්ණයක් බැවින් බවත් පවසා සිටි අතර විදුලි කණු සඳහා එම වර්ණය උචිත නොවන බව පවසා සිටි අතර,
ලබන්නා වූ සිංහල,හින්දු අළුත් අවුරුද්ද සැමගේ සිතුම්,පැතුම් ඉටුවෙන සුභ නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරමින් අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**<u>ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා</u>**

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමන් විසින් අදහස් දක්වමින් සභාවේ කසළ එක්රැස් කිරීමට ත්‍රී වීල් රථයක් ගැනීම සඳහා යෝජනා ඉදිරිපත් කරමින්

සාකච්ඡා කලද මීට පෙර තමන් විසින් අයවැය යෝජනා සඳහා මෙම යෝජනාව ඉදිරිපත් කල බව පවසා සිටි අතර, රාස්සගල මාර්ගය කාපට් දමා සංවර්ධනය කලද දින 3ක් යාමට මත්තෙන් වලවල් සෑදී තිබෙන අයුරු දක්නට ලැබුන බවත්,එහි විධිමත් අයුරින් සංවර්ධනයක් සිදු නොවූ බවත් පවසා සිටින ලදී. තමන් විසින් මීට පොරොතුවද මේ සම්බන්ධයෙන් පැවසූ පරිදි මාර්ග සංවර්ධන අධිකාරිය දැනුවත් කර සභාවෙන් ලිපියක් සකස් කර යවන ලෙස පවසා සිටින ලදී.

තුඹගොඩ බස් නැවතුම් ස්ථානයක් සකස් කිරීම සඳහා මන්ත්‍රීවරු කණ්ඩායමක් ලෙස එකතු වී සාංඝිකාරාමයේ ගරුතර ස්වාමීන් වහන්සේ හමුවට ගොස් සාර්ථක වැඩ පිළිවෙලක් දියත් කිරීම සුදුසු බව පවසා සිටි ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමන් විසින් තව දුරටත් අදහස් දක්වමින් ආදි ශිෂ්‍ය සංගම් එකමුතුව විසින් පැවැත්වීමට නියමිත අවුරුදු උත්සවය සඳහා ප්‍රදර්ශනය කරන ලද බැනරය කපා ඉවත් කර තිබූ අතර ඒ සඳහා සභාවේ මන්ත්‍රීවරියක් මුල් වී ක්‍රියා කිරීම කනගාටුවට කරුණක් බවත්, මන්ත්‍රීවරු ලෙස තම ගෞරවය රැක ගනිමින් අවශ්‍ය දේ පමණක් සිදු කිරීමට වගබලා ගැනීම සුදුසු බවත් මෙහිදී පවසා සිටින ලදී.

**10. අවසානය**

ගරු සභාපතිතුමන් විසින් අදහස් දක්වමින් අද දින සභාවට පැමිණි සියළු දෙනාට ස්තුති වන්ත වන බව පවසා සිටි අතර,සභාවේ අවශ්‍ය දේට වඩා අනවශ්‍යය දේ බොහොමයක් කථාකල බවත් අවශ්‍ය දේ පමනක් කථා කරමින් වටිනා කාලය රැක ගන්නා ලෙසත් මෙහිදී පවසා සිටින ලදී.

කවුරුන් කෙසේ ආවේගශීලිව හෝ එක් එක් ශෛලීන් අනුව කථා කලද එහි අවසන් ප්‍රතිඵලය පැමිණෙන්නේ සභාපතිවරයාට බවත්,පුද්ගලික මතවාද ඉස්මතු කරමින් දේශපාලන ගමන නොයා සැබෑ තත්වය තේරුම් ගෙන ජනතා හිතවාදී ගමනක් යා යුතු බව පවසා සිටින ලදී.

එමෙන්ම සභාවේ කොන්ත්‍රාත් කටයුතුවලින් 1% සුභ සාධන සංගමයට ගැනීම පිලිබඳ සමහරක් චෝදනා මුඛයෙන් කථා කලද එම මුදල වෙන්වන්නේ මරණ,විශ්‍රාම යාම්,දන්සල්

,වෙසක් උත්සව හා අනෙකුත් පුන්‍ය කටයුතු සඳහා පමණක් බවත් එම මුදල් කිසි විටෙක තමන් හෝ සභාවේ නිළධාරීන් තම නිවෙස් කර ගෙන නොයන බවත් පවසා සිටි ගරු සභාපතිතුමන් විසින් කොන්ත්‍රාත් කරුවන් අපහසුතාවයට ලක්වෙන්නේ ඔවුන්ට පොළියට මුදල් ලබාදෙන ඇතැමුන් විසින් ඔවුන්ගේ මුදල් සූරාගෙන කැම නිසා බවත් තමන් සෑම විටම ක්‍රියා කරන්නේ රුපියලක් හෝ පාඩු නොවී සභාවට ලාභයක් හා කීර්තියක් ගෙන ඒමට බවත් පවසා සිටින ලදී.

සභාව විසින් අධ්‍යයන කටයුතු සඳහා පිටස්තර සභා වෙත යනු ලබන්නේ සභාව කිසි ආකාරයකින් කඩාවැටී නොවන බව පැවසූ ගරු සභාපතිතුමන් විසින් සභාව දෙස ද්වේශයෙන් බලා ප්‍රකාශ නිකුත් නොකරන ලෙසත්, රටේ තිබෙන දේශපාලන ක්‍රමවේද අනුව ,සීමිත සම්පත් කළමණාකරණය කර ගනිමින් කිසිවෙකුට අසාධාරණයක් නොවන පරිදි කටයුතු කළමණාකරණය ගනිමින් ක්‍රියා කල යුතු බවත් පවසා සිටින ලදී.

තව දුරටත් අදහස් දැක්වූ ගරු සභාපතිතුමන් විසින් හිටපු සභාපතිතුමන් සතුව අත්දැකීම් සමුදායක් පවතින බවත් ඉදිරියේදී අවශ්‍ය කටයුතු සඳහා සහාය ගැනීමට අපේක්ෂා කරන බවත් පවසා සිටි අතර 2002‑ 2005 වකවාණුවේ අදූරු යුගයක් තිබූ බවට පසුගිය සභාවේ ප්‍රකාශයක් කල තිබූ බැවින් ඒ සඳහා පිළිතුරක් ලබදීමට අවශ්‍ය බව පවසා සිටින ලදී. තම පියා තනතුරේ ගෞරවය රැක ගනිමින් ඉතා ගෞරවාන්විතව ක්‍රියා කල අයෙක් බවත්, සභාවේ සේවය කරන ස්ත්‍රීන් කෙරෙහි අයුතු යෝජනා ඉදිරිපත් කරමින් තනතුර හෑල්ලුවට ලක් නොකර, යහපත් චේතනාවෙන් සංවර්ධන කටයුතුවල නිරත වෙමින් රුපියලක මුදලක් සොරකම් නොකර අවංකව ක්‍රියාකල බවත්, එතුමා 2005 වර්ෂයේ කරන ලද මෙහෙයට 2006 වර්ෂයේ කාර්යය සාධන තරඟයෙන් ලංකාවේ ප්‍රථම ස්ථානය ලබා ගැනීමට හැකි වූ බවත්, පලාත් සභාවේ හෝ රජයේ සහයක් නොමැතිව එතුමා කරන ලද මෙහෙය අගය කරන බවත් පවසා සිටින ලදී.

එමෙන්ම සභාව මතවාදීව බිඳ දැමීමට කිසිවෙකු කුහක ලෙස ක්‍රියා කරයි නම් ඒ සඳහා ඉඩ නොදෙන බව පවසා සිටි ගරු සභාපතිතුමන් විසින් තම දෙඅත් පිරිසිදු හෙයින් අවශ්‍යය ඕනෑම විටෙක සභාවෙන් ඉවත් වීමට තමා සූදානම් බවත් මෙහිදී පවසා සිටින අතර සභාවේ සිටින එක පැය හෝ වංචාවෙන් හා දූෂනයෙන් තොරව ක්‍රියා කිරීම තම අභිප්‍රාය බවත් පවසා සිටින ලදී.

කිනම් දේශපාලන මතිමතාන්තර තිබුනද සභිකයන් 16 දෙනාම එක අයුරින් සළකන බව පවසා සිටි ගරු සභාපතිතුමන් විසින් ගරු නාගරික මන්ත්‍රිනි ජී.චන්ද්‍රලතා මැතිතුමියගේ ක්‍රියා කළාපයෙන් හොඳ ආදර්ශයක් ලබාගත් බවත් සෑම සංවර්ධන කටයුත්තකදීම එතුමිය තමන්ව සහභාගී කොට ගත් බවත් පවසා සිටි අතර ඉදිරියේදී කොට්ඨාශ වශයෙන් පිහිටුවන කසළ කමිටු සඳහා සෑම දෙනාගේම සහයෝගය අපේක්ෂා කරන බවත් පවසා සිටින ලදී. එමෙන්ම ඉදිරියේදී මන්ත්‍රිවරුන්ට ප්‍රතිපාදන ලබාදීම සම්බන්ධයෙන් ක්‍රියා කරන බව පවසා සිටි ගරු සභාපතිතුමන් විසින් ලබන්නා වූ සිංහල හින්දු අළුත් අවුරුද්ද සැමට සුභ නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරමින් ප.ව. 3.00 ට පමන සභාවේ කටයුතු අවසන් කරන ලදී.

චමික ජයමිණි විමලසේන

සභාපති,

බලංගොඩ නගර සභාව.